# මූල්‍ය බුද්ධි ඒකකය

# ප්‍රතිලාභී හිමිකරුවන් පිළිබඳව වූ තොරතුරු සැපයීම

ඔබගේ ආයතනය (නෛතික පුද්ගලයකු) බලපත්‍රලාභී බැංකු/මූල්‍ය සමාගම්, බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්/රක්ෂණ සමාගම් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන්නන් (උදා: ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්, මුදල් ප්‍රේෂණය කරන ආයතන) සමඟ මූල්‍ය ගනුදෙනු සිදුකරන අවස්ථාවේ දී,

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ නියමයන්ට අනුව නිකුත් කරන ලද ගනුදෙනුකරු නිසි පරිදි හඳුනා ගැනීමේ රීති (Customer Due Diligence Rules) අනුව ඔබ ආයතනයේ "ප්‍රතිලාභී හිමිකරු" (Beneficial Owner) පිළිබඳව වූ පහත තොරතුරු අදාල මූල්‍ය ආයතනය වෙත සැපයිය යුතු වේ.

a) සම්පූර්ණ නම

b) ජාතික හැඳුනුම්පත් අංකය හෝ වෙනත් හඳුනාගැනීමේ අංකයක්

c) ස්ථිර ලිපිනය/පදිංචි ලිපිනය

d) හිමිකම් ප්‍රතිශතය

"ප්‍රතිලාභී හිමිකරු" යනු නෛතික පුද්ගලයෙකුගේ අවසාන හිමිකාරීත්වය හෝ පාලනය දරන (ප්‍රාග්ධනයෙන් 10% හෝ ඊට වඩා දරන) ස්වභාවික පුද්ගලයකු වේ. එමෙන්ම කිසියම් පුද්ගලයකු වෙනුවෙන් ගනුදෙනුවක් සිදුකරන මෙන්ම නෛතික තැනැත්තෙකුගේ ක්‍රියාකාරීත්වය කෙරෙහි අවසන් ඵලදායී පාලනයක් සහිත ස්වභාවික පුද්ගලයන් ද මේ යටතේ ගැනේ. ඒ අනුව ප්‍රතිලාභී හිමිකරුවන් විවිධාකාරයෙන් දැක්විය හැක.

ප්‍රතිලාභී හිමිකරු හඳුනාගැනීම පිළිබඳ සරල උදාහරණයකි;




මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේ දී ඔබ ආයතනය පිලිබඳව මූලික තොරතුරු සැපයීමට අමතරව ඉහත සඳහන් පරිදි ප්‍රතිලාභී හිමිකරු පිළිබඳව වූ තොරතුරු ද සැපයිය යුතු වේ.

මූල්‍ය ආයතන විසින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සහ ප්‍රතිලාභී හිමිකරුවන් පිළිබඳව තොරතුරු රැස්කිරීම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් වලට අනුකූලව සිදු වේ. ඒ සඳහා සියලු මූල්‍ය ආයතනයන් හි ගනුදෙනුකරුවන් ගේ සහාය අපේක්ෂා කරමු.

**වැඩිදුර තොරතුරු විමසීම්**
ඔබගේ මූල්‍ය ආයතනය හෝ
අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
☎ 011-2477509 011-2477692 @ fiu@cbsl.lk www.fiusrilanka.gov.lk